**<u>ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීම</u>**

1) දැනට ක්‍රියාත්මක අංක 1885/31 හා 2014.10.22 දරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලබා වසර 03ක් ගත වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම ද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියට උසස්වීම් ලබා වසර 03ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම ද සම්පූර්ණ කළ යුතු වේ.

2) ඉහත සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වීමට පෙර එනම්, 2008.07.01 දිනට පෙර බැඳුනු නිලධාරීන්ගේ එකී කාලසීමාවට අදාල කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධයෙන් ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි සඳහන් කොන්දේසි අදාල කර ගනු ලැබේ.

3) රාජ්‍ය සේවා කොමිෂන් සභා අධ්‍යාපන සේවා කමිටු ලේකම් විසින් මා වෙත යොමු කර ඇති ESC/APP/SLPS/07/71/2017 හා 2019.01.21 දිනැති ලිපිය අනුව 2008.07.01 දිනට පසු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලද නිලධාරීන් සඳහා වසරකට විභාග අවස්ථා 02 බැගින් හිමි විය යුතු බැවින් ඒ අනුව කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරිම සඳහා හිමි විය යුතු විභාග වාර සංඛ්‍යාව තීරණය වේ.

4) ඉහත සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉමට එළඹෙන දිනට පෙර අදාල කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමට අපොහොසත් වූ නිලධාරියෙකුට එම **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමෙන් පසු,** කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2011 ප්‍රකාරව අයදුම් කළ හැකි වේ. එහිදී නියමිත විභාග වාර සංඛ්‍යාව ඇතුලත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇත්නම් එම සමත් වූ දිනය දක්වා ද එකී කාලසීමාව ඉක්මවා සමත් වී ඇත්නම් හිමි විය යුතු අනුගාමී විභාග වාර සංඛ්‍යාව අනුව අවසන් පරීක්ෂණය පැවැත්වූ දිනය දක්වා ද කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීමට කටයුතු කෙරෙන අතර එම කාල සීමාවේදී කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට අදාලව විලම්භනයකින් තොරව වැටුප් වර්ධක ගෙවිය හැකි වේ.

5) තවද, කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීම් සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක ඉහත ක්‍රමවේදයන් 2024.06.30 දින හෝ එදිනට පෙර සමත් වීමට නියමිත දිනය එළඹෙන නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සඳහා පමණක් වලංගු වන අතර 2024.07.01 දින හෝ ඊට පසු සමත් වීමට නියමිත දිනය එළඹෙන නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීම සම්බන්ධයෙන් 2023.03.29 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 2/2023 හි විධිවිධාන අදාල වන බවද දන්වමි.

අවශ්‍ය ලේඛන

01. විධිමත්ව සම්පූර්ණ කරන ලද EC (EST 07) ආකෘති පත්‍රය
02. කාර්යක්ෂමතා කඩ ඉම සමත් වීමට අදාල ප්‍රතිඵල ලේඛනය/ ලේඛන හා එයට පෙර පෙනී සිටි සියලු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවල ප්‍රතිඵල ලේඛන
03. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම ස්ථිර කරන ලද ලිපිය
04. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලිපිය
05. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලිපියට අනුව වැඩ භාරගන්නා ලද ලොග් සටහන් පිටපත
06. අධි සේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වීම් ලබා ඇත්නම්
07. එම පත්වීම ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කරන ලද ලිපිය
08. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කරන ලද ලිපිය (අංක 1086/26 හා 1999.07.02 දරණ සේවා ව්‍යවස්ථාවට අනුව බඳවා ගන්නා නිලධාරීන් සඳහා පමණක් අදාල වේ)

(04 – 08) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම ස්ථිර කිරීම සඳහා මෙම ලේඛන යොමු කර ඇත්නම් නැවත එවීම අවශ්‍ය නොවේ

09. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ උසස් වීම් ලිපි
10. යාවත්කාලීන කරන ලද චර්යා සටහනෙහි පිටපත

EC (EST 07)ආකෘති පත්‍රය
(2012.10.18 දින සංශෝධනය කරන ලදී.)

# රජයේ නිලධරයකු කාර්යක්ෂමතා කඩඉම්/දෙපාර්තමේන්තු පරීක්ෂණ/භාෂා ප්‍රවීණතා සඳහා සහන ලබාදෙන ලෙසරාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් කරනු ලබන ඉල්ලීම.

1. **අයදුම්කරු පිළිබඳ තොරතුරු:**
   1.1 සම්පූර්ණ නම :..........................................................................................................
   1.2 උපන් දිනය :..........................................................................................................
   1.3 ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................
   1.4 කිසියම් සේවයකට අයත් නම්,
      1.4.1 එම සේවය :..........................................................................................
      1.4.2 පන්තිය :........................................ ශ්‍රේණිය :..........................................
   1.5 දැනට දරණ තනතුර :..........................................................................................
   1.6 සේවා ගණය (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව) :..........................................
      1.6.1 ශ්‍රේණිය :..........................................................................................
   1.7 වර්තමාන සේවා ස්ථානය :..........................................................................................

2. **අපේක්ෂිත සහනය පිළිබඳ තොරතුරු :**
   2.1 කාර්යක්ෂමතා කඩඉම් සහනයක්ද, භාෂා ප්‍රවීණතා සහනයක්ද, දෙපාර්තමේන්තු පරීක්ෂණ සහනයක්ද, යන්න.
   (නියමිත කොටුව තුළ √ සලකුණ යොදන්න)
   කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ☐ භාෂා ප්‍රවීණතාවය ☐ දෙපාර්තමේන්තු පරීක්ෂණ ☐
   2.2 අපේක්ෂිත සහනය (නියමිත කොටුව තුළ √ සලකුණ යොදන්න)
   නිදහස් කිරීමක් ☐ සහන කාලයක් ☐
   2.3 සහනය අපේක්ෂා කිරීමට හේතු (නියමිත කොටුව තුළ √ සලකුණ යොදන්න. උපදෙස් මාලාවේ දක්වා ඇති ලිපිලේඛණ ඇමුණුම් ලෙස ඉදිරිපත් කරන්න)

| | කාර්යක්ෂමතා කඩඉම් සඳහා | භාෂා ප්‍රවීණතා සඳහා | දෙපා./ පරීක්ෂණ සඳහා |
|---|---|---|---|
| 2.3.1 නියමිත කාලසීමාව තුළ විභාග නොපැවැත්වීම. | ☐ | ☐ | ☐ |
| 2.3.2 නිලධරයාට පෞද්ගලික වූ හේතු මත විභාගයට පෙනී සිටීමට නොහැකිවීම. (උදා: රෝගීවීම, ප්‍රසූත නිවාඩු ආදිය) | ☐ | ☐ | ☐ |
| 2.3.3 වයස අවුරුදු 45 සම්පූර්ණ වන දිනය හා කාර්යක්ෂමතා කඩඉමට එළඹෙන දිනය 2001.10.01 දිනට පෙර එළඹීම. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2001 අනුව) | ☐ | ▒ | ▒ |
| 2.3.4 නියමිත සුදුසුකමට සමාන වෙනත් සුදුසුකම් සපුරා තිබීම. | ☐ | ☐ | ☐ |

   2.3.5 වෙනත්(අදාළ හේතුව කෙටියෙන් සඳහන් කරන්න)
   ..........................................................................................................
   ..........................................................................................................

3. **කාර්යක්ෂමතා කඩඉම/භාෂා ප්‍රවීණතාව/දෙපාර්තමේන්තු පරීක්ෂණය පිළිබඳ තොරතුරු :**
   3.1 සහනය අපේක්ෂා කරන්නේ කාර්යක්ෂමතා කඩඉම්/දෙපා.පරීක්ෂණ සඳහා නම්,
   3.1.1 නියමිත කඩඉම/දෙපා.පරීක්ෂණය :..........................................................
   3.1.2 එයට අදාළ වන ශ්‍රේණිය/තනතුරට පත්වූ දිනය :..........................................
   3.1.3 කාර්යක්ෂමතා කඩඉමට/දෙපා.පරීක්ෂණයට එළඹෙන දිනය:..........................................
   3.1.4 කාර්යක්ෂමතා කඩඉම් විභාගය/දෙපා.පරීක්ෂණය දැනටමත් සමත් වී ඇත්නම්, සමත් වූ දිනය :..........
   3.1.5 (අ) මීට පෙර මෙම කාර්යක්ෂමතා කඩඉම/දෙපා.පරීක්ෂණය සඳහා සහන කාලයක් ලබා තිබේද?............................